**විසර්ජන ශීර්ෂය 185 - විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය**

**විගණකාධිපති වාර්තාව - 2012 වර්ෂය**

1.1 විගණන විෂය පථය

විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 ජුනි 13 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන නිරීක්ෂණ

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.10 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත්කරන ලද විගණන විමසුම් 02 කට 2013 මාර්තු 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාල ගණනය කළ හැකි ගණුදෙනුවල වටිනාකම රු.3,308,345 ක් විය.

### (ආ) විසර්ජන ගිණුම

#### (i) මුළු ප්‍රතිපාදනය හා වියදම

සමාලෝචිත වර්ෂය සඳහා අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. 525,838,760 ක් වූ අතර වර්ෂය අවසාන වනවිට ඉන් රු. 520,879,557 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ඉතිරිවීම් රු. 4,959,203 ක් වී තිබුණු අතර එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 0.94 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2012 දෙසැම්බර් 31 දිනට ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| පුනරාවර්තන | 59,290,000 | 66,738,760 | 896,456 | 1.34 |
| මූලධන | 9,400,000 | 459,100,000 | 4,062,747 | 0.88 |
| එකතුව | 68,690,000 | 525,838,760 | 4,959,203 | 0.94 |

(ii) අයවැය විචලනය

- වැය විෂයයන් 02 ක් සඳහා සලසා තිබුණු රු. 700,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.
- වැය විෂයයන් 04 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 50 ත් සියයට 99 ත් අතර පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

(iii) ඉන්ධන හා විදුලි වියදම් කළමනාකරණය

ඉන්ධන හා විදුලි වියදම් සඳහා අයවැය ඇස්තමේන්තු මගින් සලසා තිබුණු ප්‍රතිපාදන ඇතුළත වියදම් කළමනාකරණය කර ගත යුතු බවත්, ඒ සඳහා කිසිදු අතිරේක මුදලක් ලබා නොදෙන බවත්, මු.රෙ. 66 මගින් ප්‍රතිපාදන මාරුකිරීම භාණ්ඩාගාරය විසින් අනුමත නොකරන බවත් 2012 පෙබරවාරි 16 දිනැති අංක 156 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයෙන් උපදෙස් දී තිබුණත්, භාණ්ඩාගාර අනුමැතිය මත එම වැය විෂයයන් සඳහා මු.රෙ. 66 මගින් රු. 1,987,000 ක් ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂයේදී මාරුකර තිබුණි.

(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

විෂය අංක 18501 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 1,200,000 | 946,400 | 300,000 | 951,062 | 2,000,000 | 3,750,220 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අමාත්‍යාංශයේ අත්තිකාරම් ගිණුම් කටයුත්ත වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු උපරිම ශේෂ සීමාව රු.2,000,000 ක් වුවත්, සමාලෝචිත වර්ෂය අවසාන වනවිට එම හර ශේෂය රු.3,750,225 ක් වීම නිසා රු.1,750,220 කින් සීමාව ඉක්මවා කටයුතු කර තිබුණි.

1.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

1.4.1 වාර්ෂික කාර්යසාධන වාර්තා

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පී/එෆ්ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 දින හා 2004 පෙබරවාරි 20 දින දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ 402 හා 402(1) ප්‍රකාර මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත අමාත්‍යාංශය විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්ය සාධන වාර්තාව 2013 ජූනි 06 දින වනවිටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

1.4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර තිබුණේ 2012 පෙබරවාරි 14 දින දීය.

1.4.3 අභ්‍යන්තර විගණනය

මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීමට විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය අසමත්වී තිබුණි.

1.4.4 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

2000 මාර්තු 15 දිනැති අංක PF/PE/07 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය 2000 ජූනි 12 දිනැති IAI/2000/1 හා 2011 ජනවාරි 15 දිනැති IAI/2001/1 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛ ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා කාර්තුවකට එක් වරක්වත් රැස්විය යුතු වුවත් 2012 වර්ෂයේදී එක් රැස්වීමක් පමණක් අමාත්‍යාංශය විසින් පවත්වා තිබුණි.

1.5 වත්කම් කළමනාකරණය

වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම

මුදල් අමාත්‍යාංශය සතු මෝටර් වාහනයක් 2010 නොවැම්බර් 22 සිට විධිමත් අනුමැතියකින් තොරව අමාත්‍යාංශය විසින් භාවිතා කර තිබුණි.

1.6 අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **ජනාධිපති ලේකම් කාර්යාල චක්‍රලේඛ** | | |
| 2010 මැයි 14 දිනැති අංක CA/1/17/1 දරන චක්‍රලේඛය | - | අමාත්‍යවරයාගේ කටයුතු සඳහා වෙන්කර තිබුණු නිල වාහන 03 ට අමතරව තවත් වාහන 05 ක් එම කටයුතු සඳහා යොදාගෙන තිබුණි. |
| **රාජ්‍ය මුදල් චක්‍රලේඛ** | | |
| 2009 සැප්තැම්බර් 18 දිනැති අංක PF 437 දරන චක්‍රලේඛය | - | අමාත්‍යාංශය සතු වාහන 07 ක් සඳහා රක්ෂණ ආවරණ ලබාගෙන නොතිබුණි. |
| **ව්‍යවස්ථාපිත විධිවිධාන** | | |
| 2012 අගෝස්තු 16 දිනැති අංක අමප/12/1099/504/098 දරන අමාත්‍ය මණ්ඩල තීරණයේ 5 ඡේදය | 127,500 | දැයට කිරුළ ලේකම් කාර්යාලයට අවශ්‍ය නිලධාරීන් ද්වීතීන පදනම මත වසරක කාලයක් සඳහා බඳවා ගැනීමට තීරණය කර තිබියදී ඊට පටහැනිව මසකට රු. 15,000 බැගින් වැටුපකට කොන්ත්‍රාත් හා තාවකාලික පදනම් මත නිලධාරීන් දෙදෙනෙක් බඳවා ගෙන ඔවුන් සඳහා පිළිවෙලින් රු. 75,000 ක් හා රු. 52,500 ක් වැටුප් ලෙස ගෙවීම් කර තිබුණි. |

1.7 කාර්ය සාධනය

විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය විසින් 2011 සිට 2016 දක්වා කාල පරිච්ඡේදය වෙනුවෙන් පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්ම අනුව 2012 වර්ෂයේදී කාර්යයන් 18 ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද ඒවා අතරින් කාර්යයන් 02 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

1.8 වංචනික ස්වරූපයේ ගනුදෙනු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශයේ අතිරේක ලේකම් විසින් දැයට කිරුළ සඳහා ලබාගත් අත්තිකාරම් මුදල්වලින් රු. 30,821 ක් වටිනා ආහාරපාන හා භාණ්ඩ මිලදී ගෙන තිබුණද ඒවා අමාත්‍යාංශය වෙත භාරගත් බවට තොග ලේඛනවල සටහන් කර නොතිබූ අතර අදාල භාණ්ඩ අමාත්‍යාංශයේ කටයුතු සඳහා යොදාගෙන නොතිබුණි.

(ආ) අමාත්‍යාංශයේ රියදුරන් දෙදෙනෙකු විසින් 2012 පෙබරවාරි මාසය සඳහා එකම වාහනයක එකම දිනවල හා එකම වේලාවක රාජකාරී කිරීම වෙනුවෙන් ගමන් වියදම් දීමනා ලෙස වෙන් වෙන් වශයෙන් රු. 5,250 බැගින් ලබාගෙන තිබුණි.

(ඇ) එකක් රු. 9,000 බැගින් රු.36,000 කට ලිපිගොනු කබඩ් 04ක් සඳහා භාණ්ඩ ලබාගැනීමකින් තොරව 2012 නොවැම්බර් 16 දින ගෙවීම් කර තිබුණි. ගෙවීම් කළ කබඩ් 04 කින් 02ක් ආයතනයට පසුව සපයා තිබුණු අතර ඉතිරි කබඩ් 02 සපයා නොතිබුණි. කබඩ් 02කට අදාල රු.18,000 ක රජයේ මුදල් මාස 04ක පමණ කාලයක් පෞද්ගලික පාර්ශවයක් පරිහරණය කර 2013 මාර්තු 13 දින අමාත්‍යාශයට ලබා දී තිබුණි.

(ඈ) දැයට කිරුළ ලේකම් කාර්යාලයට අවශ්‍ය ලියන මේස, කබඩ් හා සෝපා කට්ටල මිලදී ගැනීම සඳහා 2012 දෙසැම්බර් 11 දින රු. 342,965 ක් සැපයුම් ආයතනයකට ගෙවා තිබුණි. සෝපා කට්ටල සඳහා රු. 80,010 ක් ගෙවා තිබියදී එම සෝපා කට්ටල වෙනුවට පුටු 08 ක් රු. 70,712 කට මිලදී ගෙන තිබුණි. ඒ අනුව ඉතිරි රු. 9,298 ක් 2013 අප්‍රේල් 23 දින වනවිටත් සැපයුම්කරු භාරයේ තබාගැනීමට කටයුතු නොකර රජයේ මුදල් අයථා පරිහරණය යොමු කර තිබුණි.

1.9 අනාර්ථික ගනුදෙනු

---

එක් සේවයකයකුට වර්ග අඩි 198ක පමණ ප්‍රමාණයකින් යුත් සේවකයින් 74 දෙනෙකුට වර්ග අඩි 14,660 ක විශාල ගොඩනැගිල්ලක් කුලියට ගෙන තිබුණි. 2012 ජනවාරි සිට නොවැම්බර් දක්වා කාලයට රු.12,100,000 ක්ද 2012 දෙසැම්බර් මාසයට රු.300,000 ක්ද වශයෙන් එකතුව රු.13,400,100 ක් ගොඩනැගිලි කුලි වශයෙන් ගෙවා තිබුණි. ඒ අනුව එක් සේවකයකු සඳහා වාර්ෂිකව රු.181,082 ක ගොඩනැගිලි කුලියක් අමාත්‍යාංශය විසින් ගෙවා තිබුණි.

1.10 මානව සම්පත් කළමනාකරණය

---

අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යා

---

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 09 | 07 | 02 |
| (ආ) | තෘතීයික මට්ටම | 01 | 01 | - |
| (ඇ) | ද්වීතියික මට්ටම | 24 | 16 | 08 |
| (ඈ) | ප්‍රාථමික මට්ටම | 20 | 13 | 07 |
| (ඉ) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 01 | 01 | - |
| | එකතුව | 55 | 38 | 17 |

සමාලෝචිත වර්ෂය අවසාන වනවිට පුරප්පාඩු 17 ක් පිරවීමට අපොහොසත් වී තිබුණි.